## ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2016

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ගනුදෙනු හා ක්‍රියාකාරකම් 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් පිළිබඳව පාර්ලිමේන්තුවට සභාගත කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වුවත් 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 6.5.1 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2 සංස්ථාවේ ක්‍රියාකාරකම් පිළිබඳ අදහස්

#### 2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | සේවා අංශයේ පාරිභෝගිකයන් සඳහා ගෙවිය යුතු වටිනාකම් | 543,895,470 | විස්තරාත්මක උපලේඛන |
| (ආ) | ගෙවිය යුතු බදු | 488,204,669 | වයස් විශ්ලේෂණය |

#### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 3,518,915,427 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන් සියයට 95කට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතුව තිබූ අතර ඉන් රු. 969,867,663 ක් හෙවත් සියයට 28 ක් වර්ෂ 5කට වඩා කල් ඉකුත් වූ ණය ශේෂයන් විය.

(ආ) වර්ෂ 5කට වඩා වැඩි කාලයක සිට විවිධ ණයගැතියන් ලෙස රු. 7,450,055 ක වටිනාකමක් අඛණ්ඩව ගිණුම්වලට ගෙන තිබුණද අදාල පාර්ශව හඳුනාගැනීමට හෝ අදාල වටිනාකම් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විවිධ අරමුණු හා විවිධ පාර්ශව සඳහා දෙන ලද වර්ෂ 3 හා වර්ෂ 5 ඉක්මවූ අත්තිකාරම් වටිනාකම් පිළිවෙලින් රු. 115,801,112 ක් හා රු. 159,646,390 ක් නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

------------------------------------

පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව සත්‍ය ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු. 11,043,549 ක් විය. කෙසේ වුවත්, උපලේඛන අනුව දැක්වුනු ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු. 4,792,320 ක් විය. මේ නිසා එම ශේෂයන් දෙක අතර රු. 6,251,229 ක පැහැදිලි නොකළ වෙනස්කමක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද ණයගැති ශේෂය හා ආයතන 4කින් ලද ණයගැති ශේෂයන් තහවුරු කිරීම් අතර එකතුව රු. 148,801,970 ක වෙනසක් පැවතුණු අතර මෙම වෙනස්කම් සඳහා හේතු වූ කරුණු විගණනයට පැහැදිලි නොකරන ලදී.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

--------------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 396(ඈ) | 2016 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06ක කාලයක් ඉක්මවූ වටිනාකම රු. 289,188 ක් වූ චෙක්පත් 5 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ III වන පරිච්ඡේදය. | යෙදවුම් මත බදු වටිනාකම රු. 8,321,188 ක් හා නිමවුම් මත බදු වටිනාකම රු. 33,000,669 ක් සමාලෝචිත වර්ෂයේ ගණුදෙනු මත පැනනැග තිබූ නමුත්, එකතු කළ අගය මත බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත. | සමාලෝචිත වර්ෂයට අදාල ජාතිය ගොඩනැගීමේ බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉල්ලා ඇති පරිදි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 2009 ජුලි 01 දිනැති අංක ඩීඑම්ඡ්/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයේ තොරතුරු ඇතුළත් කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිඝණක උපාංග හා මෘදුකාංග සම්බන්ධව වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනත. | 2006 ජනවාරි සිට 2015 ජුලි දක්වා ජීවන වියදම් දීමනාව සේවකයින්ට ගෙවීම මත සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකය පිළිවෙලින් රු. මිලියන 307.82 ක් හා රු. මිලියන 41.97 ක් ප්‍රේෂණය නොකිරීම නිසා අධිභාර ලෙස පිළිවෙලින් රු. මිලියන 153.91 ක් හා රු. මිලියන 20.98 ක් සංස්ථාවට ගෙවීමට සිදු වී තිබුණි. |
| (උ) | 1979 දෙසැම්බර් 20 දිනැති හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද අංක 121/1979 දරන චක්‍රලේඛයේ 2(ඇ) ඡේදය | ඇණවුම් සමඟ චෙක්පත් අත්තිකාරම් ලබාදීමෙන් පසු දින 30 ක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවත් එකතුව රු. 77,540,015 ක් වූ එලෙස ලබා දුන් අත්තිකාරම් වර්ෂ 3කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොමැතිව පැවතුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

සංස්ථාවේ ප්‍රධාන අරමුණු වූ (i) සිවිල් ඉංජිනේරු හා අනෙකුත් ඉංජිනේරු ව්‍යාපෘති විමර්ශනය කිරීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම (ii) ව්‍යාපෘති කළමනාකරණ සේවා හා උපදේශන සේවා සැපයීම (iii) දේපල සංවර්ධන කටයුතු අත්පත් කර ගැනීම (iv) පෙර සූදානම් කළ කොන්ක්‍රීට්, සවි ගැන් වූ කොන්ක්‍රීට් සහ පූර්ව ප්‍රත්‍යබල කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම (v) ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය හා ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනය කිරීම, අලෙවි කිරීම, ආනයනය කිරීම හා අපනයනය කිරීම (vi) ඉංජිනේරුමය හා ශිල්පීය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම (vii) ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය, ඉදිකිරීම් විධික්‍රම හා ඉදිකිරීම් ශිල්පක්‍රම පිළිබඳ පර්යේෂණ කටයුතු ක්‍රියාවේ යෙදවීම වේ.

2016 වර්ෂයේදී ඉහත අරමුණු ඉටුකරගැනීම සඳහා ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සංස්ථාවේ ඉදිකිරීම් අංශය විසින් ක්‍රියාත්මක ඉදිකිරීම් ව්‍යාපෘති 257 කින් ඉදිකිරීම් ව්‍යාපෘති 109 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට කිසිඳු පිරිවැයක් දරා නොතිබුණි.

(ආ) ඉදිකිරීම් ව්‍යාපෘති 13ක කාර්යසාධනය ශුන්‍ය මට්ටමේ පැවති බව නිරීක්ෂණය විය. සංස්ථාව විසින් ක්‍රියාත්මක කර තිබූ අනිකුත් ප්‍රධාන ව්‍යාපෘතිවල කාර්යසාධන තොරතුරු පහත පරිදි වේ.

පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති - මාතලේ දිස්ත්‍රික්කය

2011 වර්ෂයේදී ආර්ථික අමාත්‍යාංශය විසින් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති 52ක් සංස්ථාවට ලබා දී තිබුණු අතර මාස 6කින් එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘති උපදේශක වූ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවීම් සහතික නොකිරීම නිසා උපකොන්ත්‍රාත්කරුවන් හට රු. 42,428,732 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ii) සියයට 90ට වඩා වැඩියෙන් සම්පූර්ණ කරන ලද මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති 11ක් සඳහා රු. මිලියන 43.96ක වටිනාකමක් අයකර නොගෙන පැවතුනි.

පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති - රත්නපුර දිස්ත්‍රික්කය
---------------------------------------------------------------

(i) ව්‍යාපෘති වටිනාකම රු. මිලියන 34.11 ක් හා රු. මිලියන 26.8 ක් වූ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් 2011 වර්ෂයේදී උපකොන්ත්‍රාත් ලබා දී තිබුණි. කෙසේ වුවත්, එහි ඉදිකිරීම් වැඩ 2017 මාර්තු 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. මේ සඳහා ගෙවූ සවලීකරණ අත්තිකාරම් රු. මිලියන 7.46 ක් හා රු. මිලියන 6 ක වටිනාකම් නැවත අයකර ගැනීමට සහ උපකොන්ත්‍රාත් ගිවිසුම් වගන්ති ප්‍රකාරව ඇවරකිරීමේ අලාභ රු. මිලියන 3.4 ක් හා රු මිලියන 2.6 ක් අදාල උපකොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, උපකොන්ත්‍රාත්කරුවන් විසින් ලබා දී තිබූ කාර්යසාධන හා සවලීකරණ අත්තිකාරම් බැදුම්කරවල වලංගු කාල සීමාවන් ද කල්ඉකුත් වී තිබුණි.

(ii) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බිල්පත් සහතික නොකිරීම නිසා ගොරකඇල - තෙප්පනාව මාර්ගයේ උපකොන්ත්‍රාත්කරු හට රු. 1,550,945 ක වටිනාකමක් වැඩියෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) කහංගම කොටස සහ කොස්ගල කොටසේ මාර්ග ඉදිකිරීම් වැඩ 2011 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කළ යුතු වුවත් අදාල කොන්ත්‍රාත් කාලය තුල මාර්ග ඉදිකිරීම් කටයුතු උපකොන්ත්‍රාත්කරුවන් විසින් සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වුවත්, සංස්ථාව විසින් එම උපකොන්ත්‍රාත්කරුවන්ගෙන් ඇවරකිරීමේ අලාභ රු. 5,389,574 ක වටිනාකමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ල නවීකරණය කිරීම හා රථවාහන අංගනය ඉදිකිරීම.
---------------------------------------------------------------------------------------------

(i) 2009 දෙසැම්බර් 13 වන දිනට පෙර නවීකරණ කටයුතු සම්පූර්ණ කළ යුතු තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එහි නවීකරණ කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.

(ii) ඉදිකිරීම් වැඩ ප්‍රමාද වීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් වටිනාකමින් රු. 27,244,208 ක් ඇවර කිරීමේ අලාභ ලෙස අයකර ගැනීමට කටයුතු කරන බව සංස්ථාවට දැනුම් දී තිබුණි.

(iii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රථවාහන අංගනයේ සෝපානය සවිකිරීමේ කොන්ත්‍රාත්තුව ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් සමාගම වෙත ලබා දී තිබුණු අතර ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම නිසා එම ආයතනය විසින් රු. මිලියන 96.94 ක වන්දි මුදලක් ඉල්ලා සංස්ථාවට එරෙහිව නඩු පවරා තිබුණි.

(ඈ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 08/සී/73/344/002 දරන සාකච්ඡා මාර්ගයෙන් ලබාගනු ලබන කොන්ත්‍රාත් සඳහා අදාල අත්තිකාරම් සහ කාර්යසාධන බැදුම්කර/ඇපකර ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් සංස්ථාව නිදහස් කර තිබුණි. නමුත්, උපකොන්ත්‍රාත් මත සිදුකරනු ලබන කාර්යයන් සඳහා මෙම සහනය අදාල නොවිය යුතු බවට තීරණය කර තිබියදී වටිනාකම රු. මිලියන 104.152 ක කොන්ත්‍රාත් සංස්ථාව විසින් උපකොන්ත්‍රාත් ලබා දී තිබුණි.

**3.2 ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(අ) 2016 වර්ෂයේදී යන්ත්‍ර කුලියට දීමෙන් ලද රු. 7,695,261 ක එකතු කළ අගය මත බදු වටිනාකම බදු ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) සංස්ථාවට නිරවුල් කළ යුතු එකතු කළ අගය මත බදු රු. මිලියන 123.84 ක් සහ ජාතිය ගොඩනැගීමේ බදු රු. මිලියන 7.8 ක් නිරවුල් නොකර පැවතුනි.

(ඇ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවීමට තිබුණු රු. මිලියන 253.8 ක වටිනාකම නොගෙවා පැවතුනි.

(ඈ) ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් පිළියෙල කළයුතු වාර්තා සහ ජාතිය ගොඩනැගීමේ බදු රු. 1,190,229 ක වටිනාකමක් 2018 ජනවාරි 31 දින වන විටත් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඉ) අනුමත බැංකු අයිරා පහසුකම රු. මිලියන 6.8 ක් ඉක්මවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා අයිරා පොලී ලෙස රු. මිලියන 15.8 ක් ගෙවා තිබුණි.

(ඊ) බැංකු සැසඳුම් වාර්තා තුල 2012 වර්ෂයේ සිට නිරවුල් නොකරන ලද හඳුනා නොගත් හර සහ බැර ශේෂය පිළිවෙලින් රු. 111,605 ක් සහ රු. 1,328,763 ක් පැවතුනි.

(උ) විගණන නියැදි පරීක්ෂාවට අනුව ඉදිකිරීම් ව්‍යාපෘති පහකට අදාල ගිවිසුම් ඇතිකරගෙන නොතිබුණු බව නිරීක්ෂණය වු අතර උපකොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කර නොතිබුණි.

(ඌ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ක්‍රියාත්මක කරන වැඩපළවල් 17 කින් වැඩපළ 09 ක් 2016 වර්ෂය තුල රු. මිලියන 22.02 ක අලාභයක් ලබා තිබුණි.

(එ) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය 344 ක් වුවත් 2016 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය 754 ක් විය. නමුත්, 410 ක් වු අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඒ) ඇනවුම් සමඟ චෙක්පත් අත්තිකාරම් වටිනාකම රු. 465,516 ක් මෙම වාර්තාවේ දිනය වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඔ) මුළු යන්ත්‍රෝපකරණ බලඇනියෙන් යන්ත්‍රෝපකරණ 91 ක් භාවිතා කළ නොහැකි මට්ටමේ පැවතුනි.

**3.3 සංස්ථාවේ අනිකුත් අංශවල මෙහෙයුම් කාර්යසාධනය**

ඉදිකිරීම් අංශය, ඉදිකිරීම් උපාංග අංශය, යාන්ත්‍රික හා විදුලි අංශය, විශේෂ මෙහෙයුම් අංශය සහ උපදේශන අංශය යන අංශ 5 ක් යටතේ සංස්ථාව ක්‍රියාත්මක වන අතර එක් එක් අංශයේ සාරාංශගත කාර්යසාධනය පහත දැක්වේ.

**(අ) ඉදිකිරීම් අංශය**

සමාලෝචිත වර්ෂය තුල මෙම අංශයට අදාල රත්මලාන ඇලුමිනියම් වැඩපළ සහ මාලිගාවත්ත යන්ත්‍රෝපකරණ කුලියට ලබා දීමේ වැඩබිම කිසිඳු ආදායමක් උත්පාදනය කර නොතිබුණි.

**(ආ) ඉදිකිරීම් උපාංග අංශය**

-----------------------------

පසුගිය වර්ෂය හා සැසදීමේදී රත්මලාන පෙරසවි අංගනයේ ආදායම සහ මෙහෙයුම් ලාභය පිළිවෙලින් සියයට 24 ක් හා සියයට 9.16 කින් පිරිහීමට ලක්ව තිබුණි. තවද, දංකොටුව වඩු නිෂ්පාදන අංගනයේ සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 71 කින් ඉහල ගොස් ඇති බවට වාර්තා වුවද පසුගිය වර්ෂ 18 තුල අඛණ්ඩව පාඩු ලබා තිබුණි. මේ අතර, පැලියගොඩ පෙරසවි අංගනය පසුගිය වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂය තුලදීද කිසිඳු ආදායමක් ජනනය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුල රු. 115,296 ක වියදම් දරා තිබුණි.

**(ඇ) යාන්ත්‍රික හා විදුලි අංශය**

------------------------------

(i) පැලියගොඩ පිහිටි වැඩබිම් අංක 102 සහ වැඩබිම් අංක 104 හි මෙහෙයුම් කටයුතු පිළිවෙලින් 2013 හා 2014 වර්ෂවල සිට අඛණ්ඩව පාඩු ලබා තිබුණු අතර 2013 වර්ෂයේදී රු. මිලියන 1.6 ක් ලෙස වැඩබිම් අංක 102 හි වාර්තා වූ අලාභය සමාලෝචිත වර්ෂය වන විට රු. මිලියන 45 ක් දක්වා වර්ධනය වී තිබුණි. මේ අතර, 2013 වර්ෂයේදී රු. මිලියන 7.43 ක් ලෙස වැඩබිම් අංක 104 හි වාර්තා වූ ලාභය සමාලෝචිත වර්ෂය වන විට රු. මිලියන 49 ක අලාභයක් බවට පත්ව තිබුණි.

(ii) මාතලේ ඩොලමයිට් වැඩබිම (වැඩබිම් අංක 1100) 2006 වර්ෂයේදී හැර වර්ෂ 17 ක් අඛණ්ඩව පාඩු ලබා තිබුණි. කෙසේ වුවත්, 2015 වර්ෂයේදී රු. මිලියන 10 ක් වූ මෙහෙයුම් අලාභය සමාලෝචිත වර්ෂය වන විට රු. මිලියන 6 දක්වා සියයට 37 කින් අඩු වී තිබුණි.

(iii) රත්මලාන වැඩබිමේ (වැඩබිම් අංක 888) සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැය සහ අනිකුත් වියදම් වර්ධනය වීම නිසා රු. මිලියන 21.81 ක මෙහෙයුම් අලාභයක් ලබා තිබුණි.

**(ඈ) විශේෂ මෙහෙයුම් අංශය**

-----------------------------

ගලපාත ඇස්පෝල්ට් වැඩබිම සඳහා අමුද්‍රව්‍ය සැපයීමට සමාලෝචිත වර්ෂය තුල රු. 29,642,269 ක වටිනාකමක් සැපයුම්කරුවන් වෙත ගෙවා තිබූ අතර රු. 13,016,723 ක වටිනාකමකින් යුක්ත අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් විසින් සපයා නොතිබුණි. තවද, මෙම වැඩබිම සඳහා 2016 දෙසැම්බර් 25 දින දක්වා වර්ෂ 2 ක කාලයක් සඳහා කුලී ලෙස රු. 1,800,000 ක වටිනාකමක් ගෙවා තිබුණි. කෙසේ වුවත්, ඇස්පෝල්ට් නිෂ්පාදන කටයුතු සිදුකර තිබුණේ දින 3 ක් පමණි. එම නිසා මෙම වැඩබිමෙන් රු. 25,580,485 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණි.

**3.4 හඳුනාගන්නා ලද පාඩු**

----------------------------

එකතු කළ අගය මත බදු, ආර්ථික සේවා ගාස්තු සහ ජාතිය ගොඩනැගීමේ බදු නියමිත කාලය තුල නොගෙවීම නිසා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සංස්ථාව වෙත රු. 124,823,483 ක අධිභාරයක් පනවා තිබුණි. එකතු කළ අගය මත බදු සහ ආර්ථික සේවා ගාස්තු පිළිවෙලින් රු. 472,732,052 ක් සහ රු. 53,898,882 ක වටිනාකමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සී - සිටි ව්‍යාපෘතියේ කඩ කාමර වෙන්කර ගැනීම සඳහා 2013 සහ 2014 කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන මුදල් ලෙස රු. මිලියන 94.44 ක වටිනාකමක් විවිධ ආයතනවලින් රැස්කරගෙන තිබුණි. නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණ නොකිරීම නිසා කඩ කාමරයක් වෙන්කර ගැනීම සඳහා ප්‍රධාන මුදල් ලෙස රු. 735,000 ක් ගෙවූ කඩ හිමියකු විසින් රු. මිලියන 1 ක වන්දි මුදලක් ඉල්ලා සංස්ථාවට එරෙහිව නඩු පවරා තිබුණි.

(ආ) දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු ලියාපදිංචිය අක්‍රීය කරන ලද සැපයුම්කරුවන් තුන්දෙනෙකු සඳහා 2016 වර්ෂයේදී එකතු කළ අගය මත බදු ලෙස රු. 341,368 ක වටිනාකමක් ගෙවා තිබුණි.

(ඇ) අදාල විකුණුම්කරු හඳුනා නොගැනීම නිසා අත්තිකාරම් ගෙවීම් ගිණුමේ එකතුව රු. 60,974,121 ක බැර ශේෂයක් පැවතුනි.

**3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දී තිබු සංස්ථාවේ සම්පත්**

---------------------------------------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට සේවකයින් 12 දෙනෙකුත්, පළාත් අමාත්‍යාංශය සඳහා එක් සේවකයකු හා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට සේවකයින් 4 දෙනෙකු මුදාහැර තිබුණි.

**3.7 නිෂ්කාර්ය වත්කම්**

----------------------

වාහන හා ටේලර් 3 ක් රු. 610,000 ක පිරිවැයකට සහ පිරිවැය සඳහන් නොකරන ලද ඩබල් කැබ් රථයක් සහ පිරිවැය රු. 3,500,000 ක් වූ යන්ත්‍ර සූත්‍ර සඳහා සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම නිසා නිෂ්කාර්යව පැවතුනි.

**3.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 හා 2011 වර්ෂවලදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ බොහෝමයක් තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සංස්ථාවට ලැබී තිබුණද, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 5 ක් සඳහා නිලධාරීන් 26 දෙනෙකු ඉහල වැටුප් තලයන් යටතේ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 1.2 වගන්තිය අනුව පත්කිරීමක් කළ හැක්කේ අනුමත සේවක සංඛ්‍යාවේ තනතුරුවලට පමණි. නමුත්, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 41 ක් සඳහා අතිරික්ත සේවකයින් 624 දෙනෙකු 2016 දෙසැම්බර් 31 දිනට බඳවාගෙන තිබුණි.

(ඇ) 2006 අගෝස්තු 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 (ii) සහ 2009 නොවැම්බර් 25 දිනැති අංක ඩීඑම්එස්/ඊ3/43/4/265/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපි අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව නව තනතුරු 11 ක් සඳහා සේවකයින් 15 දෙනෙකු බඳවාගෙන තිබුණි. ඉන් තනතුරු 7 ක් සඳහා බඳවාගත් සේවකයින්ගේ පත්වීම් ස්ථිර කර තිබීම විගණනයේදී ප්‍රශ්ණකාරී විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------------

### 4.1 සංයුක්ත සැලැස්ම

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද සමාලෝචිත වර්ෂයට අදාලව යාවත්කාලීන කර නොතිබුණි. සංයුක්ත සැලැස්මෙහි ඇතුලත්ව තිබූ පහත සඳහන් අරමුණු හා පරමාර්ථ ලඟා කරගැනීම සඳහා අසාර්ථක වූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති වලින් සියයට 5 බැගින් වාර්ෂික අතිරේක ආදායමක් ඉපයීමට හා සංස්ථාවේ එක් එක් අංශවලින් සාමාන්‍ය අවම වාර්ෂික ආදායම සියයට 5 බැගින් වර්ධනය කර ගැනීම සඳහා අපේක්ෂා කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ආදායම පිරිහීමට පත්ව තිබුණි.

(ආ) වර්තමාන ණය මට්ටම සියයට 20 කින් අඩුකර ගැනීමට සහ ණය අයකරගැනීම සඳහා පද්ධතියක් හඳුන්වා දීමට සංස්ථාව විසින් අපේක්ෂා කර තිබුණු අතර අපේක්ෂිත මට්ටම දක්වා ණය වටිනාකම අඩු වී නොතිබුණි.

(ඇ) ව්‍යාපාර ක්‍රියාකාරකම් විවිධාංගීකරණය යටතේ නව ආදායම් ඉපයීමේ ක්ෂේත්‍ර හඳුනාගැනීම හා ව්‍යාපාර ක්‍රියාකාරකම් පුළුල් කිරීම ඉටුකර ගැනීමට නෙහැකි වී තිබුණි.

### 4.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව 2017 සිට 2021 කාලපරිච්ඡේදය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එය සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර නොතිබුණු අතර පහත දැක්වෙන මූලික කරුණු එහි අඩංගු වී නොතිබුණි.

- වාර්ෂික අයවැය ( ආදායම, මෙහෙයුම් වියදම්, සංවර්ධන වියදම්, මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තා, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුලත්ව)
- යෝජිත ප්‍රධාන ආයෝජනයන්, ධාරිතා වර්ධනය කිරීම සහ ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුලත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම.
- මානව සම්පත් සංවර්ධන සැලැස්ම.
- ණය ආපසු ගෙවීමේ සැලැස්ම.
- අභ්‍යන්තර විගණන සැලැස්ම.

### 4.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සියයට 46 සිට සියයට 70 දක්වා සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගෙන නොතිබුණි.

### 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් 2014 හා 2015 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා 2018 ජූලි 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ගෙවිය යුතු බදු හා ඒ සඳහා අධිභාර ගිණුම් ගතකර නොතිබීම.<br>(ii) පාලන ගිණුම් සසඳා නොතිබීම. |
| (ආ) මූල්‍ය පාලනය | (i) ඇණවුම් සමඟ චෙක්පත් මගින් අත්තිකාරම් ලබාදීම.<br>(ii) දීර්ඝ කාලයක සිට පැවත එන ණයගැතියන්ගෙන් මුදල් අයකර නොගෙන පැවතීම.<br>(iii) සේවාදායකයන් සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කිරීමට සැලකිය යුතු ප්‍රමාදයක් පැවතීම.<br>(iv) ගැණුම් අත්තිකාරම් නිරවුල් නොකර දීර්ඝ කාලයක සිට පැවතීම.<br>(v) ඉදිකිරීම්වලට අදාල දිගුකාලීන රඳවා ගැනීම් මුදල් නිරවුල් නොකිරීම. |
| (ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය | (i) වෙනත් ආයතන වෙත මානව සම්පත් මුදා හැරීම.<br>(ii) අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් බඳවා ගැනීම.<br>(iii) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් කිරීම. |
| (ඈ) වත්කම් කළමනාකරණය | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට සහ නිෂ්කාර්ය වත්කම් විධිමත් පරිදි උපයෝජනය කිරීමට කටයුතු නොකිරීම. |
| (ඉ) තොග පාලනය | සියළුම වැඩබිම්වල වාර්ෂික තොග සමීක්ෂණය සිදු නොකිරීම. |